# මොසම් පිළිබඳ කාරණා.

# SEASONAL NOTES.

## උෂ්ණය සහ තෙතමන සමවූ පහත රට.

## THE HOT AND MOIST LOW COUNTRY.

### ජනවාරි.

වර්ෂාව අඟල් 4.21 පමණ ලැබේ. මාර්තු සහ අප්‍රේල් යන මාසවල සිටවීමට අල මේ මාසේ සපයාගතයුතුවේ. දෙසැම්බර්මස සිටවනලද තක්කාලි සුලඟෙන් කඩ වැටීම නවතන පිණිස කෝටු සිටවිය යුතුයි. තක්කාලි ගස් ඉක්මණින් උසවැඩිවා යනවානම් දලු කඩාදැමීම යුතුවේ. ඉන්නල උදුරා එය දිය සීරුව නැතිවූද, සෙවන ඇතිවූද ස්ථානයක රැස්කළ යුතුයි. ඉඩම්හි පස බුරුල්කර තැබීමෙන් මේ කාල යේදී ඇතිවන උෂ්ණයේ අධික කමෙන් වාෂ්පාකාරව නැතිව යන්නාවූ දිය සීරුවේ නැතිවීම අඩුකළහැකිවේ. කුකුලලවල කොළ ඉදෙන්ට ප්‍රථම හාරාගත යුතුයි. නැතහොත් අල තැම්බීම යහපත්සේ නොවේ.

### පෙබරවාරි.

වර්ෂාව අඟල් 1.59ක් පමණවේ. වාතය සහ සූර්‍ය්‍ය රශ්මිය පසාශ්‍රය වනසේ භූමිය සකස්කළ යුතුයි යම් බෝග වර්ග වවා තිබෙන ස්ථානයන්හි පස බුරුල්කර කොළ යනාදිය අතුරා දැමිය යුතුයි. කොළ යනාදිය සපයාගැනීම අමාරු නම් පස පමණක්වත් බුරුල්කර තැබිය යුතුයි. යම් යම් ලපටි පැල ජාති සෙවනකර දැමීම සුදුසුවනනයි. ඔක්තෝම්බර් නොවැම්බර් යන මාසවල සිටවනලද පිපිඤ්ඤා, ලූණු තක්කාලි, බෝංචි යනාදිය මේ කාලයේදී කඩා ගැණීමට දැන් පුළුවන්වේ.

### මාර්තු.

වර්ෂාව අඟල් 2.77ක් පමණවේ මේ මාසයේ භෝග සිටවීම අධිකව කළනො හැකියි අල බතල සිටවන ඉඩම් දැන් ලෑස්තිකළ යුතුයි. මාසේ අන්තිමයේදී ගහල, කොඩොල්, කුකුලල යනාදිය සිටවිය යුතුයි. අඩියක් පමණ ගැඹුර ඇතිව කානු කපා ඊට කොළ පෝර පුරවා පුලුස්සා පසුව ගොම පෝර මිශ්‍රකෙරීම යහපත් වේ. ඉතාම දිය සීරුව ඇති ස්ථානයන්හි පස් කඳු ගසා ඒ මතුපිට අල සිටවිය යුතුයි.

### අප්‍රේල්.

වර්ෂාව අඟල් 13 08ක් පමණ සාමාන්‍යයෙන් මේ මාසේදී ඇතිවේ. යල වර්ෂා කාලය මේ මාසේ බැවින් එළවළු, පලතුරු යනාදිය සිටවීමට මේ ඉතා හොඳ කාල යකි. බඩ ඉරිඟු, උක්ගස්, මෑ බෝංචි, අල බතල, රට කජු යනාදිය අගෝස්තු මාසේ හාරාගැනීමට සහ කඩාගැණීමට හැකිවනපරිදි දැනට ඒ සිටවිය යුතුයි. වර්ෂාව වැඩිවෙන්ට ප්‍රථම කානු, අගල් යනාදිය සුඩකර රොඩු කුණු ඉවත්කර දැමිය යුතුයි. දෙසැම්බර් මාසේ හාරාගැණීමට පුලුවන්වෙන පරිදි ඉඟුරු සිටවීම යහපත් වේ. මැයි, ජූනි, සැප්තැම්බර් යන මාසවල සිටවීමට ඉන්නල අතුකෑලි සපයාගත යුතුයි.

### මැයි.

වර්ෂාව අඟල් 10.18ක් පමණවේ. වර්ෂා කාලය ඉවරවෙන්ට ප්‍රථම සිටවන්ට සුදුසු බෝග ජාති සියල්ලක්ම සිටවීමට මේ කාලය ඉතා සතුටුදායකවේ. ලූණු සිට වීමටද මේ ඉතා හොඳ මාසයකි. බන්ඩක්කා සිටවීමෙන්ද අධික ප්‍රයෝජන බාල-

පොරොත්තුවියහැකියි. ඉන්නල පැලෑටින් දූන් සිටවිය යුතුයි. තක්කාලිවලටද හොඳයි, අලවැල්වලට ඉනි සිටවිය යුතුයි. බුලත් කොරටුවක් සිටවීමටද සුදුසු කාලයයි. බටු මිරිස්ද දුම්ඇටද පාත්තිවල දමනු.

## ජූනි.

වර්‍ෂාව අඟල් 10.9"ක් පමණ ලැබේ. පසුගිය මාසේ සිටවා ඉවරකල නොහැකිවූ පැල ජාති සියල්ලක් දූන් සිටවා නිමකල යුතුයි. සලාද, රාබු යනාදිය සිටවීමට යහපති. අගෝස්තු සැප්තැම්බර් මාසවල කඩාගැණීමට පුළුවන්වෙන පරිදි පතෝලද සිටවීම හොඳයි. ගවයින්ට ආහාර පිණිස තෘණාදීන් සිටවීම යොග්‍යවේ. සුලඟෙන් කඩාවැටෙන්ට හැකි සියලුම ගස් වර්‍ගාදියට කෝටු සිටවිය යුතුයි. දුම් කොළ වැවීමට බිම සකස්කරණ කාලයයි.

## ජූලි.

වර්‍ෂාව අඟල් 3 50ක් පමණ ලැබේ. මේ මාසයේ වැඩිය පැල ජාති සිටවිය නොහැකියි. වල් පැලෑටි යනාදිය උදලුගාදමා පාත්ති සුඬකල යුතුයි. සලාද සහ රාබු උදුරා ගැණීමට කාලය ප්‍රමාණවේ. බත්බක්කා එලදැරීමද දූන් පටන්ගන්නවා ඇත. තිචිති සිටවීම මේ මාසේ කලහැකියි. ලබු, පතෝල, කරවිල යනාදියට මැහි දමනු. පලතුරු වර්‍ගවල ඇට සිටවීමට යහපත් කාලයවේ, දුම්ගාල්ද සිටවීමට කාලයවේ.

## අගෝස්තු.

වර්‍ෂාව 3.35ක් පමණයි මේ සාමාන්‍යයෙන්ම වේලුම් සහිත මාසයක්වන බැවින් වැට කඩුලු බැඳීමාදියෙහිද, ඉඩම් අද්දර බඩවෙට් යනාදිය සුඬකර දැමීමටද පුළුවන්වේ පෙබරවාරි මාසේ කලවැඩ මේ මාසේද කලයුතුයි. කෙසෙල් සහ අන්නාසි ගැණ සැලකිය යුතුයි. බතල හැරීමට සහ බඩ ඉරිඟු කරල් පැසීමේද කාලයයි. ජනවාරි මාසේ සිටවනලද ඉන්නල හාරුගත යුතුයි. මාර්තු මාසේ සිටවනලද ගහලද මේ මාසේ ඉදිරියහැකිවේ.

## සැප්තැම්බර්.

වර්‍ෂාව අඟල් 5.13ක් පමණ ලැබේ. ඔක්තෝම්බර්, නොවැම්බර් යන මාස්වල සිටවීමට භූමිය සකස් කෙරීම මේ මාසේ කලහැකි බැවින් ඒ පටන්ගත යුතුයි. ගෙඩි ජාති පැල යනාදිය සිටවීමට උවමනා පරිදි වලවල් සකස්කල යුතුයි. මෙසේ සකස්කරණලද වලවල්හී කොළ පෝර සහ අලුද, ගොමද යෙදිය යුතුයි. ලූනු බැසී තිබේනම් ඒ උදුරනු. මල් ඇට, එළවලු ඇට යනාදිය එකතුකිරීමේ කාලයයි. ජනවාරි පෙබරවාරි මාසවල ඉදිරීමට ඉන්නල අතුකැලි දූන් සිටවනු.

## ඔක්තෝම්බර්.

වර්‍ෂාව අඟල් 19 07ක් පමණ ඇතිවේ. පැලෑටි සිටවීමට මේ ඉතා යහපත් කාලය බැවින් ඒ සිටවීම ආරම්භකල යුතුයි. එලවලුවලටද මේ මාසය ඉතා හොඳයි. කාපු යනාදියද මේ මාසේ සිටවීම යහපති.

## නොවැම්බර්.

වර්‍ෂාව අඟල් 14.48ක් පමණ ලැබේ. හුලන්කිරිය, පරිප්පු, ආටිචෝක් යනාදිය මේ මාසේ සිටවිය යුතුයි. ඉල් පසුවාගෙන්වන අන්තරා නිසා ලබු, පිපිඤ්ඤා, පුහුල් යනාදිය සිටවීම ලබන මාසේට කල්දමනු. උදලුගෑම සහ බිම් සකස් කෙරීම කල යුතුයි.

### දෙසැම්බර්.

වර්ෂාව අඟල් 7.02ක් පමණකි. ලබු, පුහුල්, පිපිඤ්ඤා යනාදිය සිටවීමටද දූන් සුදුසුවේ. කොළ පෝර සහ අළු යොදා භූමිය සකස්කර තක්කාලි සිටවීම දූන් කටයුතුයි. මේවා අඩි තුනක් පරතරය ඇතුව සිටවීම සුදුසුයි. අල හෑරීමද මේ මාසේ කළයුතුයි.

---

## සම ශීතෝෂ්ණය මධ්‍යස්ථ උඩරට.

## THE INTERMEDIATE MID-UPCOUNTRY.

---

### ජනවාරි.

වර්ෂා සාමාන්‍ය අඟල් 4.91ක් පමණ ලැබේ. පැළ සිටවීම මේමාසේදී සම්පූර්ණ සෙන්ම නැවැත්විය යුතුයි. කොළ යනාදිය එකතුකර ඉන් ද්‍රවනා පෝරක් ලබා ගැනීම මුල්කර ඒ වලක් කපා එහි දිරායාමට හැර පසුව එකතුකරගත යුතුයි. කරාබු එල දරණ කාලය මෙයවේ. එහි මල් විවෘතවෙන්ට ප්‍රථම කඩා පැදුරු උඩ අතුරා වියලිය යුතුයි. සියඹලා, අන්නාසි සහ කොව්න් ගොරක ඉදෙන කාලය මෙයවේ

### පෙබරවාරි.

වර්ෂාව අඟල් 2 32ක් පමණ ලැබේ. වර්ෂයේ ඉතා උෂ්ණ මාසයවේ. වාෂ්ප කරණය නවතන පිණිස පස නිතරම බුරුල්කර තැබිය යුතුයි භෝග ජාතීන්ට සහ පැළ පෝච්චි යනාදියට වතුර වත්කරණවිට පත්‍රාවින්ද සේදීයන ආකාර වත් කරන්නේනම් ඒ පැලෑටින්ගේ යහපත් ජීවනයට ඒද එක් හේතුවක්වේ. කැලේ සීයම් යනාදිය අල සහිත පැලෑටින්ගේ කොළ මේ කාලයේදී වියලී ගොස් අල නිශ්චලව තිබෙණ නිසා වතුර වත්නොකරණු. ලාවුලු, ලොවී යනාදියෙහි ගෙඩිද බිගෝනියා යනාදියෙහි මල්ද දූන් ඇතිවේ.

### මාර්තු

වර්ෂාව ,අඟල් 3 52ක් පමණවේ. උෂ්ණත්වයේ අධිකකම නිසා තෘණයන් පවා මේ මාසේ වියලීයයි. මේ මාසේ අන්තිමට අල වැල් වගී සිටවිය යුතුයි. වතුර වත් කෙරීම, පැළ ජාතිවලට සෙවන දැම්ම, පස බුරුල්කර ඊපිට කොළ යනාදිය ඇතිර වීම මේ මාසේ කළයුතු ප්‍රධාන කටයුතුවේ. පෝච්චිවල පැළ මාරුකෙරීම දූන් කටයුතුයි දෙලුම්, වැල්වට් ඇපල් යනාදියෙහි ගෙඩිද ජැකරන්ඩා, ගිලිරිසිඩියා, සපතෝඩියා, බිගෝනියා, ඇම්හර්ස්ට්යා යනාදියෙහි මල්ද දූන් ඇතිවේ.

### අප්‍රේල්.

වර්ෂාව අඟල් 6.96ක් පමණවේ. කානු යනාදිය ඉතා හොඳට සුඩකර තැබිය යුතුයි. ස්වදේශික එලවලු වගී දූන් සිටවීමට හොඳ කාලයවේ. කෙසෙල් වතුවල වැඩ ගැණද සැලකීම යහපති. වියලි කොළ යනාදිය එහිම වළලාදැමීම සුදුසුයි. දෙඩම්, කොස්, ලාවුලු, අනෝනා යනාදියෙහි ගෙඩිද බිගෝනියා, පොයින්සියානා ගිලිරිසිඩියා යනාදියෙහි මල්ද මේ කාලයේ ඇතිවේ.

## මැයි.

වර්ෂාව අඟල් 5.53ක් පමණ බලාපොරොත්තුවිය හැකිසි. නිරිත දිග්භාගයේ මෝසම් සුලඟ පටන්ගන්ට පෙර කොළ පෝර, ගොම පෝර යනාදිය රැස්කරගත යුතුසි. මල් පාත්ති සම්පූර්ණයෙන්ම සුබකර එහි පැළ සිටවීමට සූදානම් වියයුතුසි. වැනිලා මල් තුලට පරාග මල් දැමීමේ කාලය දැන්වේ. අඹ, කජු යනාදියෙහි ගෙඩිද, සපු, මුරුත යනාදියෙහි මල්ද දැන් ඇතිවේ.

## ජූනි.

වර්ෂාව අඟල් 9.43ක් පමණවේ. නිරිත මෝසම් වැස්ස මේ මාසේදී පටන් ගනිසි වැස්ස පටන්ගත් ක්ෂණයේම ඉංග්‍රීසි එළවළු සහ මල් ඇට යනාදිය සිටවිය යුතුසි පිට්ටනිද කපා සුබකළ යුතුසි. පාත්ති සියල්ලකම හැකිනම් පෝර යොදා යහපත්සේ සිටවීමට කල්පනාකරනු. කාමරන්ගා, ජම්බු, අඹ දෙල්, කජු, රට කැකුන, නම්නම්, සැන්ඩෝරිනම් යනාදියෙහි ගෙඩිද, කැසියා, මුරුත, යනාදියෙහි මල්ද දැන් ඇතිවේ.

## ජූලි.

වර්ෂාව අඟල් 7.35ක් පමණ ලැබේ. වර්ෂාව තරමක් ලැබීමෙන් වාතය ශීතල වීම මේ මාසේ සිට පටන්ගනිසි. පැළ ජාතීන් සිටවීම දැන් පටන්ගත යුතුසි බීජ යනාදිය පාත්ති ගොඩනගා සිටවිය යුතුසි. වල් පැළෑටින් සියල්ලකම උදළුගා සුබකළ යුතුසි බඩකෙරීමේ කටයුතු පටන්ගැනීමේ ඉතාසතුටුදායක කාලය මෙය වේ. මල් අටගණ ඉවරවූ රෝස යනාදිය කප්පාදුකර තැබිය යුතුසි. මැම්ඇපල්, ඩූරියන්, කොචින් ගොරක යනාදියෙහි ගෙඩි දැන් අටගනිසි.

## අගෝස්තු.

වර්ෂාව අඟල් 5.59ක් පමණ ඇතිවේ උෂ්ණත්වය සවල්පයක් මේ මාසේ වැඩිවේ. මල් පැළෑටි තණකොළ යනාදිය උදළුගෑම යහපත්වේ. කොරටුවල පස් බුරුල්කර හැරීමද යොග්‍යයසි. උවමනාතරමට වඩා උසගිය සෙවන ගස් සියල්ලම උවමනාතරමට අතු කපා දැමිය යුතුසි අලිගැට පේර, ඩූරියන්, සැපදිල්ලා පේර, කොකෝ ප්ලම්, ගොරක, පාරා රබර් යනාදියයෙහි ගෙඩි පැසීමටද; තේක්ක, කැසියා සොලේනම් යනාදියෙහි මල්ද ඇතිවේ

## සැප්තැම්බර්.

වර්ෂාව අඟල් 5.67කි සාමාන්‍යයෙන්ම තරමක් උෂ්ණත්වය ඇති මාසයක්වේ. ඉංග්‍රීසි එළවළු යනාදිය සිටවීමට කාලය යහපත්වේ. කොළ යනාදිය පොළව මතුපිට ඇතිරීම යහපති එළවළු කොරටුවල උවමනා පැළ යනාදියට කෝටු සිටවනු. කැට ඕල්ල, නෙල්ලි, ලොවි, අනෝනා යනාදියෙහි ගෙඩිද, කැසියා යනාදියෙහි මල්ද දැන් ඇතිවේ

## ඔක්තෝම්බර්.

වර්ෂාව අඟල් 12.22ක් පමණ ලැබේ. වර්ෂාව සතුටුදායකවේ. පැළ යනාදිය සිටවීම මේ මාසේදී පටන්ගත යුතුසි. ගඩාගෙඩි ගස් ජාතිද අනිකුත් උවමනාකරන පැළෑටින්ද කප්පාදුකර දැමිය යුතුසි. පැළ බෝකිරීමේ කටයුතුවල දැන් නියුක්තවෙනු සාදික්කා, වොවන්ගා, සවර් සෝප්, පැපොල් යනාදියෙහි ගෙඩිද කැසියා, යනාදියෙහි මල්ද දැන් ඇතිවේ.

### නොවැම්බර්.

වර්ෂාව 10.14ක්වේ. පැල සිටවීම මේමාසේ නවත්වනු අල වැදිරීමට කාලය යහපත්ය. කානු, අගල් යනාදිය සුඩ කෙරීමෙන්ද, පෝච්චි මාරු කෙරීමෙන්ද සියල්ල යහපත්සේ කටයුතුයි. අනෝද වර්ගවල ගෙඩිඇතිවේ.

### දෙසැම්බර්.

වර්ෂාව අඟල් 9.30ක් පමණවේ. මෙය වාතය ඉතා වේගවත්ව ඇතිවන්නාවූ මාසයකි. පැලවලටව, පොල්වලටද කරු තැබිය යුතුයි. සෙවන ගස්ද උවමනා ස්ථානයන්හි සිටවිය යුතුයි. වියලි කොළ යනාදියෙන් වලවල් පුරවාගත යුතුයි. අනෝනා, වෙරළු, දිවුල් යනාදියෙහි ගෙඩි ඇතිවේ.

---

## ශීතාධික උඩරට ප්‍රදෙශ.

## THE COOL UPCOUNTRY DISTRICT.

---

### ජනවාරි

සාමාන්‍ය වර්ෂා අඟල් ගණන 5.55ක් පමණවේ. මෙය තෙතමන සහිතවූ ඍතුවක්ද උදය කාලයේ වැඩිකොට මීදුම සහිතදවේ මල් වතුවල ලක්ෂණ කෙරීමේ කටයුතු අන්තිමකොට කරණ කාලයයි. පැල වර්ගේ බුරුල් කෙරීමාදියෙන් වාෂ්පීකරණය බාධා කළයුතුයි. වියලි කොළ යනාදිය පැළ වර්ගේ අතුරු දැමීමෙන් මෙය ඉෂ්ටවේ. මල් පිපෙන්නාවූ පෝච්චි යනාදියට දියකරණලද ගොම වතුර වත්කළ යුතුයි. ක්ෂුද්‍ර බීජ වර්ගයන් පෝච්චියක හෝ පකිස් පෙට්ටියක වැපිරිය යුතුයි.

### පෙබරවාරි.

වර්ෂාව අඟල් 2.06ක් පමණ ලැබේ දවල් උෂ්ණවද, රාත්‍රි කාලය ශීතලවද උදේ මීදුම සහිතවද ඇතිවේ. පාත්තිවල පැල යනාදියට දියාරු පෝර යෙදීම යෝග්‍යවේ. වල් පැළෑටි, යණකොල යනාදිය උදළුගා දැමීමෙන් පාත්ති සුඩකළ යුතුයි. ස්ට්‍රෝබැරි ඉදෙන අවස්ථාව ලංවූවිට පැළය අවට පිදුරු යනාදිය ඇතිරිය යුතුයි. එලවළු ඇට යනාදිය සිටවීමට මේ සුදුසු කාලයවේ.

### මාර්තු.

වර්ෂාව අඟල් 3.08ක් පමණ ඇතිවේ. උඩරට මල්වතුවලට ඉතාමත් ලක්ෂණ කාලය මෙය වන්නේය. ඇට යනාදිය එකතුකිරීම දැන් කළයුතුයි. පිට්ටනි සෑදීම උවමනානම් ඒ ඒ ස්ථානයන්හි පොළව බුරුල්කර මැයි මාසේ පිඩලි ගැසීමට කටයුතු දැන් ලෑස්තිකළ යුතුයි.

### අප්‍රේල්.

වර්ෂාව අඟල් 5.81ක් පමණ ඇතිවේ. මදක් වර්ෂා සහිතවූ කාලයක්වේ. පසුගිය මස එකතුකාරණලද ඇට යනාදිය තවාන් දැමිය යුතුයි. වියලි අතු යනාදිය හස්වලින් කපා දමා කපනලද ස්ථානයට තාරගා යුතුයි. ඉදිරියට එන වර්ෂා කාලය බලාපොරොත්තුවී කාණු සුඩකර දැමීමම යහපති. පිට්ටනිවල සිටවීමට සුදුසු තණකොළ ඇට ජාති වැපිරීම මේ කාලයේ හොඳයි. ජූලි අන්තිම වනතෙක් අර්තාපල්, බෝන්චි, ලීක්ස් යනාදිය නොසිටවනු

### මැයි.

වර්ෂාව අඟල් 6.80ක් පමණ ඇතිවේ. මෙය වර්ෂා සහිත කාලයක්වේ. උසට වැවී තිබෙන යමකින් ආවරණය නොවූ පැළ යනාදියට කෝටු සිටවිය යුතුයි. මල් පිපී ඉවරවූ පැළ යනාදිය උදුරා ජූලි මාසේ පැළ සිටවීම අදහස්කර සකස්කළ යුතුයි. මේ කාලයේදී එළවළු සිටවීමෙන් වැඩි ප්‍රයෝජන නොමැතිවේ.

### ජූනි.

වර්ෂාව අඟල් 12 99ක් පමණ ලැබේ. අධික සුළඟින් යුක්තවූද වර්ෂාව තදින් ඇතිවූද කාලයක්වේ. වර්බිනා, පෙටූනියා යනාදි අතු කැලි දූන් සිටවා දැමිය යුතුයි. තණකොළ උවමනා ස්ථානයන්ට පිඹලි ඇල්ලීමද, පෝර රැස්කර ගැනීමද කළයුතුයි. ගස්, පැළ යනාදිය කප්පාදු කෙරීමේ කාලයයි.

### ජූලි.

වර්ෂාව අඟල් 11.75ක් පමණවේ. වර්ෂාව පසුගිය මසට අඩුවූයේවීමුත් සුළඟ ඒ ආකාරමවේ. වතු ලක්ෂණට තබාගැනීම සුළඟ නිසා ඉතා අපහසු කාලයකි. කොළ පෝර යනාදිය සාදගැනීමට රොඩුකුණු පුරවාගත යුතුයි. පලතුරු ගස් ජාති කප්පාදුකළ යුතුයි. පැළ පෝච්චි මාරු කෙරීම හොඳයි. නානා වර්ගවල මල් අතු කැලි තවාන් දැමීමෙන් සතුටුදායක ප්‍රතිඵල ලැබේ. ලූනු වර්ගයේ මල් ජාතිවල මල් පිපීම මේ මාසේ ඉතා ලක්ෂණට ඇතිවන්නේය.

### අගෝස්තු.

වර්ෂාව අඟල් 7.96ක් පමණයි. මල් ඇට යනාදිය සිටවීමට ඉතා යෝග්‍ය කාලය මෙයවේ. කොළ පෝර, පෝර සහ වැලි යනාදිය මීට උවමනා තරමට මිශ්‍රකරගත යුතුයි. අර්තාපල් හැර අතික් එළවළු එහි දූන් සිටවිය හැකියි. පැළ අවට පස් බුරුල්කර පෝර යෙදීම යෝග්‍යයවූ.

### සැප්තැම්බර්.

වර්ෂාව අඟල් 8.15ක් පමණ ලැබේ. අවුරුද්දකින් නැතිව යන්නාවූ මල් පැළ සියල්ලක් අවට පස බුරුල්කර පෝර යෙදිය යුතුයි. තද වර්ෂාවෙන් නැති නොවන පැළ සියල්ලක්ම සිටවිය යුතුයි. ඉල් පනුවා සහ මැස්සාගෙන් අන්තරා ඇති වන බැවින් ඒ ගැණ කල්පනා සහිතව පරීක්ෂාකළ යුතුයි. පෝර එකතුකිරීමේ කටයුතු කරණු:

### ඔක්තෝම්බර්.

වර්ෂාව අඟල් 11.37ක් පමණවේ. මල් වතුවල පැළ සිටවීමේ සාමාන්‍ය කටයුතුවල දූන් නියුක්ත වෙනු. බිගෝනියා යනාදි පැළ ජාති පෝච්චිවල සිටවිය යුතුයි. එළවළු යනාදියට පසුගිය මාසේ ආකාර සැලකිය යුතුයි.

### නොවැම්බර්.

වර්ෂාව අඟල් 3.93ක්වේ. කලුපාට පනුවා ගෙන් මේ මාසේදී පැළ ජාතීන්ට අන්තරය ඇතිවේ. මේ පනුවා ඇල්ලීමට උදය කාලය සුදුසුය. කුරුමිනී යනාදීන් ගෙන්ද වන අන්තරා වැලැක්වීමට හුනු අළු විසුරුවා හරිනු. අතු බඩකිරීම කටයුතුවලට කාලය යහපත්වේ.

### දෙසැම්බර්.

වර්ෂාව අඟල් 9.08ක්ය. කාලය අධික තෙතමන සහ මීදුම් සහිතයි. පැළෑටින්ගේ යහපත් ජීවනයට බාධාවූ කාලය. සූර්යයාද වළාකුල් කරණකොට ගෙණ මුළු දවසේම නොපෙණී තිබෙන්ට පුලුවන: වල් තණකොළ යනාදිය අධිකව වැවේයයි. තද මීදුමෙන් අන්තරාදායකවූ සියලුම පැළෑටි පොළ අතුවලින් උදය කාලයේ වැසිය යුතුයි.